# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2012.02.23

වේලාව : පෙ.ව.09.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රුමී මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 06.ගරු නාගරික මන්ත්‍රී | ඒ.අසංක නිල්මිණී විජේසිංහ මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජේ.මලීක්ෂා මැතිතුමා |

සහභාගී නොවුවෝ :-

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. එම්.එච්.සීලවතී මහත්මිය | ලේකම් |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන :**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2012 වර්ෂයේ පෙබරවාරි මාසයට අදාළ මහා සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බැව් පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා බළන්ගොඩ නගරයේ පාසලක නිවාසාන්තර ක්‍රීඩා උත්සවයකට සහභාගීවීමට ආරාධනා කර තිබුණ නිසා ඒ සඳහා සහභාගී වූ බැවින් සභා රැස්වීමේ කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද වූ බැවින් ඒ සම්බන්ධව පළමුව සමාව අයැදින බැව් පැවසීය. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ගම නැගුම සංවර්ධන ව්‍යාපාතිය යටතේ එක් ගමකට එක් වැඩක් " යන තේමාව මුල්කරගෙන පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 10 බැගින් මුල්‍ය ප්‍රතිපාදන ලබාදීමට පියවර ගෙන තිබෙන බැව් පැවසීය. ඒ අනුව මෙම නගර සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට ද එක් ගරු නාගරික මන්ත්‍රීවරයෙකුට රු.ලක්ෂ 10 බැගින් ලක්ෂ 60 ක මුදලක් අනුමත කර ලබාදුන් බැවින් , ඒ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන්ටත්, විෂය භාර ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් මෙම

සභාවේ ගෞරවය හා ප්‍රණාමය පළකරන බැව් පැවසීය. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ද මෙම වරප්‍රසාදය ලබාදෙන ලෙස ඉල්ලා ඇති බැවින් , බොහෝ දුරට ඉදිරියේ දී එය ලබාදෙනු ඇතැයි විශ්වාස කරන බවද සඳහන් කරන ලදී. අදාල සංවර්ධන යෝජනා සඳහා ඇස්තමේන්තු සකස් කරවා ගැනීමට කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමන්ලා වෙත උපදෙස් ලබාදෙන ලදී.

ලෝක වෙළඳපලේ ඉන්ධන මිල ඉහල යාමත් සමඟ ඉන්ධන මිල හා අත්‍යාවශ්‍ය භාණ්ඩවල වල මිළ ඉහල ගොස් ඇති බැව් පැවසීය. කුමන රජයක් බලයට පත් වුවද එය වෙනස් කිරීමට අපහසු බවත්, භාණ්ඩවල මිළ ඉහල ගියද වසර 30 ක් පමණ තිස්සේ පැවති කුරිරු යුද්ධය නිමාකර ජනතාවට බියෙන් සැකයෙන් තොරව ජීවත්වීමට අවශ්‍ය පරිසරය අතිගරු ජනාධිපතිතුමන් විසින් නිර්මාණය කර රට සීඝ්‍ර ලෙස සංවර්ධනයකට යොමුකර ඇති බැව් පැවසීය. එසේම වෙනත් කිසිදු රටක නොදෙන ආකාරයේ සහනාධාර රැසක් මේ රජය විසින් ජනතාවට ලබාදෙන බැව් පැවසීය. උදා: නොමිළයේ සෞඛ්‍ය පහසුකම්,පොහොර සහනාධාර,අධ්‍යාපනය ආදිය ඉන් කිහිපයක් යැයි පැවසූ එතුමා, මෙම කාරණාවල ඇති වැදගත්කම,අගය හා වටිනාකම අවබෝධ කරගනිමින් අතිගරු ජනාධිපතිතුමාටත්, මේ රජයටත් සහය දක්වමින් කටයුතු කිරීම අප සැමගේ යුතුකම හා වගකීම යැයි පැවසීය.

තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා, එක්සත් ජාතීන්ගේ ජනාවාස කොමිසම (U.N.හැපිටාට්) මගින් ආපදාකළමණාකරණ සම්බන්ධව වසර 02 ක කාලයක ව්‍යාපෘතියක් කිරීම සඳහා මෙම නගර සභාව තෝරාගෙන ඇති බැව් පැවසීය. මෙම ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික උපකරණ හා ව්‍යාපෘති කාර්යාලයක් නගරසභා කාර්යාලය තුළ ස්ථාපිත කිරීමට කටයුතු බව දන්වා ඇතැයි පැවසීය. මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සියළු දෙනාගේම සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා නගර සභාව තෝරාගැනීම සම්බන්ධව එම ආයතනයේ අධ්‍යක්ෂ වෙත සභාවේ ස්තුතිය පළකරන බැව් දන්වමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2012.01.26 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම**

පසුගිය සභාවේ වාර්තාවේ 09 පිටුවේ තමන් කල ප්‍රකාශයේ " 2012 අයවැය ලේඛනය මගින් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත සංවර්ධන කටයුතු සඳහා වෙන්කර ඇති මුදල් වලින් තමා වෙත වෙන්කර ඇති මුදලින් නගරයේ ළමා උද්‍යානයක් සකස් කිරීම " යනුවෙන් සඳහන් වී ඇති බවත්, එය පහත පරිදි සංශෝධනය විය යුතු බැව් ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් දන්වා එවා ඇති බැව් ගරු සභාපතිතුමන් විසින් දැන්වීය.

" අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් එක් ගමකට එක් වැඩ සටහනක් යන තේමාව යටතේ බළන්ගොඩ පැරණි නගර සභා පොළ පිහිටි ස්ථානයේ ළමා උද්‍යානයක් නිර්මාණය කිරීම යෝජනා කරමි". යනුවෙන් සංශෝධනය විය යුතු බැව් සඳහන් කර තිබුණි.

05 පිටුවේ 05:12 යටතේ " මෙම සභාව මගින් බදු දී ඇති කඩ කාමර වාර්ෂික ගිවිසුම් අත්සන් කිරීමේ ක්‍රමය පදනම්කරගෙන බදු දී ඇති අතර, සබරගමුව පළාත් සභාව විසින් 2099 වර්ෂයේ දී නිකුත් කර ඇති 01/2009 චක්‍රලේඛනයට අනුව වාර්ෂිකව ගිවිසුම් අත්සන් කරමින් බදුදිය යුත්තේ මස් සහ මාළු අලෙවි කරනු ලබන කඩ කාමර වලට පමණි. " යනුවෙන් සටහන් වී ඇති බවත්, එය " මෙම සභාව මගින් බදු දී ඇති කඩ කාමර වාර්ෂික ගිවිසුම් අත්සන් කිරීමේ ක්‍රමය පදනම්කරගෙන බදු දී ඇති අතර, සබරගමුව පළාත් සභාව විසින් 2009 වර්ෂයේ දී නිකුත් කර ඇති 01/2009 චක්‍රලේඛනයට අනුව වාර්ෂිකව ගිවිසුම් අත්සන් කරමින් බදුදිය යුත්තේ මස් සහ මාළු අලෙවි කරනු ලබන කඩ කාමර වලට පමණි. " යනුවෙන් සංශෝධනය විය යුතු බැව් ගරු උපසභාපතිතුමා විසින් දැන්වීය.

සභා වාර්තවේ වෙනත් කරුණු යටතේ පහත සඳහන් ඉල්ලීම ඉදිරිපත් කල බවත්, එය වාර්තාවේ සටහන් වී නොමැති බැව් ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින්

දැන්වීය. එය " කුමාරගම සලීම් කඩය අසල සිට කුමාරගම හංදිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී." යනුවෙන් සටහන් විය යුතු බැව් පැවසීය.

ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු උපසභාපතිතුමන් විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය.

- ❖ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමාට ර/බළන්ගොඩ ජෙයිලානී ජාතික පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයට සහභාගීවීමට අවශ්‍ය බැව් දන්වමින් මෙම අවස්ථාවේ දී සභා රැස්වීමෙන් ඉවත්ව යන ලදී.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **අනවසර වහලක් ඉදිකර තිබීම :**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, පරණ පාර, අංකඃ 64 දරණ ලිපිනයේ පදිංචි ප්‍රියන්වදා එන්ටර්ප්‍රයිසස් ආයතනයේ කළමණාකරු විසින් එවා ඇති 2012.02.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ප්‍රියන්වදා එන්ටර්ප්‍රයිසස් වෙළඳ ආයතනයට යාබඳව අලුතෙන් විවෘත කර ඇති පොත් වෙළඳසැලේ බඩු බාහිරාදිය, වෙළඳසැලෙන් පිට මහා මාර්ගය දක්වා ගොඩ ගසා ඇති බැවින් , වෙළඳසැලට භාණ්ඩ ගෙන ඒම හා ගෙන යෑමට ක්‍රමයක් නොමැති බවත්, එම වෙළඳසැල් හිමියා එම වෙළඳසැලට ඉදිරියෙන් අනවසරයෙන් වහලක් ඉදිකර ඇති නිසා වාහන නවතා භාණ්ඩ පැටවීම හා බෑමට ද නොහැකි වී ඇති බැවින් මෙම අපහසුතාවයන් ඉවත් කරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මෙම ස්ථානය පරීක්ෂාකර බලා අනවසරයෙන් කර ඇති ඉදිකිරීම ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:02 **නගර සංවර්ධනය පිණිස පරණ ප්‍රේක්ෂකාගාර භූමිය නගර සභාවට නැවත භාරදීම :**

ඉහත සදහන් කරුණට අදාළව වෛද්‍ය ඩී.සී.එස්. ද සිල්වා මහතා විසින් එවා ඇති 201.12.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පොදු වෙළඳසැල ගොඩනැගිල්ලේ වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන ගිය බවත්, නගර සංවර්ධනය පිණිස එම ස්ථානය ලබාදීමට සිදු වූ බැවින්, වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ නගර සභාවේ කටයුතු සදහා වෙන්කර ඇති කාර්යාලීය කාමරය මසකට රු.3750/- බැගින් මුදල් අයකර බදු ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **තක්සේරු ලේඛනවල පවතින අඩුපාඩු සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කිරීම :**

ඉහත සදහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයට අයත් සියළුම දේපළ 2012 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නව තක්සේරුවක් කරන ලද අතර, මේවන විට එහි වැඩ කටයුතු මේවන විට අවසන් කර අදාල ලේඛන සභාව වෙත භාරදී ඇති බවත්, එම ලේඛනතවල සංශෝධනයන් තිබේ නම්, තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර සංශෝධනය කර ගන්නා ලෙස දැණුම් දී ඇත.

මහජනතාවගේ අවශ්‍යතා කඩිනමින් සිදුකරදීම පිණිස සභා තීරණයක් මත තක්සේරු ලේඛන සංශෝධනය සිදුකිරීම පසුගිය කාලය තුළ සිදුකල බවත්, නමුත් , තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් උපදෙස් අනුව කටයුතු කල යුතු බැවින්, මේ සම්බන්ධව සාකච්ඡා කර සුදුසු තීරණයක් ගන්නා ලෙස ඉල්ලා තිබිණ.

තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කිරීමටත්, සංශෝධනයන් තිබේ නම් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර සංශෝධනය කරගැනීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **නව බස්නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ වෙළඳසැලක් ලබාගැනීම :**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, මිරිස්වත්ත, ගඟ අද්දර පාර යන ලිපිනයේ පදිංචි ඒ.සී.එම්.කයිසර් මහතා විසින් එවා ඇති 2012.01.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා නගර සභාවට අයත් බළන්ගොඩ නව බස්නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් ලබාදෙන ලෙස එම ලිපියෙන් ඉල්ලා තිබිණ.

බස්නැවතුම්පල උඩු මහලේ අංකඃ 19 දරණ කඩ කාමරය  මාසික කුළී ගෙවීමේ පදනම මත බදු ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **පුස්තකාල උපදේශක කමිටුවේ යෝජනා හා තීරණ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිම :**

2012.02.10 දින පැවති පුස්තකාල උපදේශක කමිටුවේ යෝජනා හා තීරණ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

- පුස්තකාල පොත් බැඳුම් ගාස්තු වැඩිකිරීම
  අමුද්‍රව්‍ය මිළ ඉහලයාම නිසා දැනට පොත් බැඳුම් ගාස්තු වශයෙන් අයකරන රු.50/- ක මුදල ප්‍රමාණවත් නොවන බැවින්, එම මුදල රු.100/- ක් දක්වා වැඩි කිරීම.

- මෙයට අමතරව පොතේ ප්‍රමාණය සලකා බලා  සී.ආර්.පොතක ප්‍රමාණයේ පොතක් බැඳීම සඳහා රු.175/- ක මුදලක් අයකිරීම.

  අදාල යෝජනා ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **නිවාඩු අනුමත කිරිම :**

අසනීප තත්ත්වයෙන් පසුවන බැවින්, 2012-02-23 වන දින පැවැත්වීමට නියමිත මාසික මහා සභා රැස්වීමට සහභාගීවීමට නොහැකි බැව් දන්වමින්, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **බළන්ගොඩ දිසා අධිකරණ නඩු අංක: 3089/එල්**

ඉහත අංක දරණ නඩුව 2012.02.13 වන දින අමතන ලද අතර, ඒ සඳහා පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස රු.50,000/- ක මුදලක් ලැබෙන්න සලස්වන ලෙස ඉල්ලා, නීතිඥ ඩබ්.දයාරත්න මහතා විසින් එවා ඇති 2012.02.14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

නීතිඥ ගාස්තු වශයෙන් රු.50,000/- ක මුදලක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **ප්ලාස්ටික් ව්‍යාපෘති මධ්‍යස්ථානය සඳහා තෙකලා විදුලි සැපයුමක් ලබාගැනීම :**

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පොලිතීන්/ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ මැෂින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන තෙකලා විදුලි සැපයුමක් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

අදාල විදුලි සැපයුම ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **ජල සැපයුම් පද්ධතියක් සකස් කරගැනීම - පොලිතීන්/ප්ලාස්ටික් ව්‍යාපෘතිය :**

බැංකියවත්තේ දැනට ක්‍රියාත්මක වන පොලිතීන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය සඳහා අඛණ්ඩ ජල සැපයුමක් තිබිය යුතු අතර, ඒ සඳහා එම ස්ථානයේ පවතින ජල උල්පත යොදාගත හැකි බැවින්, එම ජල උල්පත ළිඳක් ලෙස සකස් කර ජල මෝටරයක් යොදා ගබඩා ටැංකියක් ඉදිකර ජල සැපයුමක් ලබාගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.

අවශ්‍ය ජල සැපයුම ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:10 **ප්ලාස්ටික් /පොලිතීන් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීම :**

ඉහත සඳහන් මධ්‍යස්ථානයේ කටයුතු සඳහා සේවා ගිවිසුමක් මත කම්කරුවන් 4 දෙනෙකු බඳවා ගැනීමටත්, ස්ථානීය භාරකරු ලෙස සේවකයෙකු බඳවා ගන්නා තෙක් දැනට සේවයේ යොදවා ඇති සෞඛ්‍ය කම්කරු අමිල ප්‍රසාද් මහතා යොදවාගෙන 2012-03-01 දින වැඩ ආරම්භ කිරීමටත් අනුමැතිය ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 **සම්පත් පියස මධ්‍යස්ථානයේ සිදුව ඇති මුල්‍ය විෂමතාවය**

මෙම නගර සභාව මගින් පාලනය කරනු ලබන සම්පත් පියස මධ්‍යස්ථානයේ සිදුව ඇති මුල්‍ය විෂමතාවය සම්බන්ධව තමාට වගකීම භාරගත නොහැකි බැවින්, මේ සම්බන්ධව අදාල සේවකයින් කැඳවා විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙස ඉල්ලා මුරකරු එස්.ආර්.සිරිකාන්තන් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම සභාවට අනුයුක්ත් කර ඇති ප්‍රජා සංවර්ධන නිලධාරී මහතාගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම්)**

2012.01.23 දින සිට 2012.02.17 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| දිනය | විස්තරය | ව.අ. | චෙක්පත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2012.01.23 | එස්.පී.නිහාල් සමන්ත<br>බළන්ගොඩ තානායමේ දෙමහල් ගොඩනැගිල්ලේ තරප්පුව සඳහා අත්වැට ඉදිකිරීම වෙනුවෙන් ගෙවීම | 58 | 276427 | 120000/- |
| | ඩබ්.සියාම්<br>තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ලේ පේමන්ට් එකේ ටයිල් ඇල්ලීම වෙනුවෙන් ගෙවීම | 59 | 276428 | 12916/- |
| | සෙවණ ග්ලාස් හවුස්<br>තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ලේ බිම් මහලේ දොර ජනෙල් සවිකිරීම හා වෙන් කිරීම වෙනුවෙන් ගෙවීම | 60 | 276429 | 500805.46 |
| | ඒ.එම්.සාබු<br>තානායමේ නව ගොඩනැගිල්ලේ ද්වීත්ව තිරරෙදි මසා සවිකිරීම වෙනුවෙන් ගෙවීම | 61 | 276430 | 50330.70 |
| | ගාමිණී වීරක්කොඩි<br>ජේ.සී.බී.යන්ත්‍රයේ අලුත්වැඩියාවන් සඳහා ගෙවීම | 62 | 276431 | 488880.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>කුමාරගම ග්‍රාම නිලධාරී වසමේ පුපුලවත්ත මාර්ගය පැති බැම් ඉදිකිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | 66 | 276444 | 425000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>කුමාරගම ග්‍රාම නිලධාරී වසමේ මඩවලවත්ත මාර්ගය 1 අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තය වෙනුවෙන් ගෙවීම | 67 | 276444 | 189803.50 |
| | එස්.එම්.එස්.පේවර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | 67 | 280516.00 | 183300.00 |
| | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>ර/සී.සී.දෙමළ මහා විද්‍යාලයේ පසුපස මාර්ගය ii අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 68 | 276445 | 201693.24 |
| | එස්.එම්.එස්.පේවර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | 68 | 280516 | 213480.00 |
| | සභාපති, සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය<br>උඩකන්ද ගල්වල මාර්ගය අතුරු මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 69 | 276446 | 186026.00 |
| | කෙවින් සෙරමික්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>තානායමේ දෙමහල් ගොඩනැගිල්ලේ බිම් මහලේ සවිකිරීම සඳහා බේසම් හා ඒවා සවිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 70 | 276463 | 22800.00 |
| 2012-01-25 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගේ දුරකථන බිල්පත් පියවීම | 74 | 280458 | 26892.93 |

| | | | | |
|---|---|---|---|---|
| | 2287023- 2011 නොවැම්බර් /දෙසැම්බර්<br>2287024 - 2011 නොවැම්බර්/දෙසැම්බර්<br>2286565 - 2011 අගෝ/සැප්/ඔක්/නොවැම්බර්<br>2287022 - 2011 නොවැම්බර්<br>045-3452932- 2011 නොවැම්බර් | | | |
| | කේ.එම්.ජේ.ෆැෂන් සෙන්ටර්<br>තානායම සදහා තිරරෙදි ලබාගැනීම | 75 | 280465 | 42452.00 |
| | කේ.එම්.ජේ.ෆැෂන් සෙන්ටර්<br>තානායම සදහා තිරරෙදි ලබාගැනීම | 76 | 280465 | 80305.00 |
| | ජේ.ජී.පී.වික්‍රමසිංහ<br>පුස්තකාලයට හා කියවීම් ශාලාවට 2011 දෙසැම්බර් මස පුවත්පත් හා සඟරා සැපයීම. | 77 | 280462 | 16710.00 |
| | කළමණාකරු, චීප් සයිඩ් , බළන්ගොඩ<br>නිල ඇඳුම් හිමි නිලධාරීන් හා සේවක පිරිස් වෙත නිල ඇඳුම් සඳහා රෙදි සැපයීම | 78 | 280463 | 144777.50 |
| | නිව් ඔලිම්පික් ටයර් සර්විස්<br>එන්.ඩී.5124 වෑන් රථයට බැටරියක් ලබාගැනීම | 79 | 280464 | 16756.00 |
| | ජෙම්සිටි ට්‍රේඩර්ස්<br>තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල සඳහා 50000 BTU වර්ගයේ වායු සමීකරණ යන්ත්‍ර 03 සපයා සවිකිරීම | 80 | 280466 | 885000.00 |
| 2012-01-26 | කේ.ඩබ්.ජී.සිරිපාල<br>තානායම සඳහා ගෘහ භාණ්ඩ සපයා ගැනීමට අත්තිකාරම් මුදලක් ලබාගැනීම | 83 | 280494 | 146000.00 |
| 2012-01-31 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2011 ඔක්තෝබර් , නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම | 84 | 280496 | 86575.80 |
| | සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2011-12-01 සිට 2011-12-12 දින දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 95 | 280501 | 163058.30 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2011 දෙසැම්බර් මස ජල බිල්පත පියවීම - පොදු වෙළඳසැල | 99 | 280503 | 19107.20 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>කාර්යාලය - 2011 දෙසැම්බර් මස ජල බිල්පත | 100 | 280503 | 11170.88 |
| | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>2012 වසරට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ලේක්හවුස් පුවත්පත් වල පළකළ දැන්වීම් වෙනුවෙන් ගෙවීම | 107 | 280507 | 85120.00 |
| | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>2012 වර්ෂයේ නගරයේ කසළ එකතු කිරීම වෙනුවෙන් දිනමිණ පුවත්පතේ පළකළ ප්‍රසම්පාදන දැන්වීම වෙනුවෙන් ගෙවීම | 108 | 280507 | 32256.00 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක<br>2011 අගෝස්තු, සැප්තැම්බර් මාසවල විශ්‍රාම වැටුප් බිල්පත් පියවීම | 109 | 280508 | 36389.06 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක<br>2011 ඔක්තෝබර්,නොවැම්බර්,දෙසැම්බර් මාසවල විශ්‍රාම වැටුප් බිල්පත් පියවීම | 110 | 280508 | 54583.59 |

| | | | | |
|---|---|---|---|---|
| | සභාපති, සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය<br>උඩකන්ද ගල්වල මාර්ගය අතුරු මාර්ගය 1 අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ රැඳවුම් හා ගිවිසුම් ඇප තැන්පත් නිදහස් කිරීම | 111 | 280509 | 75000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>දෙහිගස්තලාව ග්‍රාම නිලධාරී වසමේ මිරිස්වත්ත ගුණානන්ද මාවත අතුරු මාර්ගය 1 අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 112 | 280513 | 74603.36 |
| | එස්.එම්.එස්.පේවර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | 112 | 280511 | 333960.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බළන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ මහමෙවුනා මාවත 1 පටුමග කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම ii අදියර කර්මාන්තයේ රැඳවුම් හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 113 | 280513 | 75000.00 |
| | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>වැලිහරනාව ජල ටැංකිය මාර්ගය ii අදියර බැම් බැඳ කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 114 | 280512 | 200788.28 |
| | එස්.එම්.එස්.පේවර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | 114 | 280511 | 213960.00 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක<br>2011 ජුලි මස විශ්‍රාම වැටුප් බිල්පත් පියවීම | 115 | 280508 | 18194.53 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක<br>2010 ඔක්තෝබර්,නොවැම්බර්,දෙසැම්බර් මාසවල විශ්‍රාම වැටුප් බිල්පත් පියවීම | 116 | 280508 | 54870.52 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක<br>2010 ජුලි,අගෝස්තු,සැප්තැම්බර් විශ්‍රාම වැටුප් බිල්පත් පියවීම | 117 | 280508 | 57183.38 |
| 2012-02-01 | බී.ගුණරත්න<br>2012-01-15 දින සිට 2012-01-31 දින දක්වා නගරයේ කසල එකතු කිරීම හා ප්‍රවාහනය වෙනුවෙන් මුදල් ගෙවීම | 1-1 | 280515 | 117000.00 |
| 2012-02-02 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>තානායම දෙමහල් ගොඩනැගිල්ලේ වහළ ඉදිකිරීම සඳහා අත්තිකාරම් මුදලක් ලබාගැනීම | 1-2 | 280517 | 182160.00 |
| | ඉන්දික එරික් සිසිල්<br>කොළඹ සිට බළන්ගොඩ දක්වා තාර හා කෝලාස්ට් බැරල් ප්‍රවාහනය කිරීම | 2 | 280518 | 15000.00 |
| | එන්.ඩී.ගුණතුංග<br>ඉදිකිරීම් කටයුතු සඳහා වැලි කියුබ් 03 ලබාගැනීම | 5 | 280521 | 18000.00 |
| | ඊ.එල්.එස්.කස්ට්‍රක්ෂන් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ්<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | 6 | 280522 | 308146.66 |
| | විජිත ගල් කැටයම්<br>බැංකියවත්ත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේ මුල්ගල තැබීමේ උත්සවය සඳහා සමරු ඵලකයක් ලබාගැනීම | 7 | 280523 | 23500.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ඩබ්.එම්.පී.වීරසේකර<br>විදී පහන් නඩත්තුව සඳහා වයර් හා බල්බ් ලබාගැනීම | 8 | 280524 | 26375.00 |
| | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br>තානායමේ දෙමහල් ගොඩනැගිල්ලේ සින්ක් සවිකිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 10 | 280525 | 15870.00 |
| | සී/ස.බලන්ගොඩ ඉඹුල්පේ කලාපීය ස.ණ.ස. සමිතිය<br>නව බස්නැවතුම්පලෙහි කඩ කාමර අංකඃ 01,14,15,28 වෙනුවෙන් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් ආපසු ගෙවීම | 12 | 280526 | 10000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>දුණුමඩලගහවත්ත මාර්ගයේ චමින්ද මයාගේ නිවස අසල මාර්ගය මුල් කොටස කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 13 | 280527 | 73590.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>මහමෙවුනා මාවත 2 පටුමග කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම ii අදියර කර්මාන්තයේ රැඳවුම් හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 14 | 280527 | 75000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>මිරිස්වත්ත ගුණානන්ද මාවත අතුරු මාර්ගය 1 අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ රැඳවුම් හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 15 | 280528 | 74986.59 |
| 2012-02-08 | ජාන් කම්පියුටර් සර්විසස්<br>කර්මාන්ත අංශය සඳහා පරිගණකයක් ලබාගැනීම | 17 | 280530 | 103000.00 |
| | බී.ජී.ගුණපාල<br>2012 ජනවාරි මස 16,17,18,19,20,23,24,26,27,30,31 දිනයන් ප්‍රිමික්ස් නිෂ්පාදනය කිරීම | 18 | 280531 | 17000.00 |
| 012-02-09 | ලක්ෂාන් ඩීසල් පම්ප් සර්විසස්<br>ජේ.සී.බී.යන්ත්‍රය සඳහා අමතර කොටස් ලබාගැනීම | 19 | 280533 | 30940.00 |
| 2012-02-13 | රිෂානා සර්විස් ස්ටේෂන්<br>ජී.කේ.1483 ට්‍රැක්ටරය පූර්ණ සේවා කිරීම | 23 | 280546 | 14083.00 |
| | දේශානී හාඩ්වෙයාර්<br>තානායම සඳහා තිර රෙදි යෙදීමට අවශ්‍ය උපාංග ලබාගැනීම හා ජල සැපයුම් උපාංග ලබාගැනීම | 26 | 280547 | 17367.00 |
| | දේශානී හාඩ්වෙයාර්<br>කාර්යාලය,තානායම,සම්පත් පියසසඳහා ජල සැපයුම් උපාංග ලබාගැනීම | 28 | 280547 | 10160.60 |
| | ජෝති ස්ටෝර්ස්<br>කාර්යාලය සඳහා ලිපි ද්‍රව්‍ය ලබාගැනීම | 33 | 280550 | 45332.50 |
| | ජෝති ස්ටෝර්ස්<br>කාර්යාලය සඳහා ලිපි ද්‍රව්‍ය ලබාගැනීම | 34 | 280550 | 66378.80 |
| | නිම්නා එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>තානායම සඳහා අවශ්‍ය සිමෙන්ති හා ඉදිකිරීම් උපාංග ලබාගැනීම | 37 | 280551 | 89494.00 |
| | නිවි මල්ලිකා ගොවිසේවා<br>සෞඛ්‍ය අංශය සඳහා වල්නාශක ලබාගැනීම | 38 | 280552 | 12150.00 |
| | කේ.ඒ.අයි.නිශාන්ත ( සිටි ඉලෙක්ට්‍රිකල්ස් )<br>විදී පහන් නඩත්තුව සඳහා අවශ්‍ය බල්බ ලබාගැනීම | 46 | 280557 | 29000.00 |
| | මෙට්‍රොපොලිටන් ඔෆීස් පුද්ගලික සමාගම<br>N.D.R0093 ඡායා පිටපත් යන්ත්‍රය 2012 වර්ෂය වෙනුවෙන් සේවා ගිවිසුම් අත්සන් කිරීම | 48 | 280559 | 16800.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ඊ.ටී.ලැබ් මැනු ෆැක්චරීන් පුද්ගලික සමාගම<br>ඇගිලි සලකුණු යන්ත්‍රය 2012 වර්ෂය වෙනුවෙන් සේවා ගිවිසුම් අත්සන් කිරීම | 49 | 280560 | 10510.08 |
| | එල්,ඊ.සී.සී.මෙටල් ක්‍රෙෂර්<br>කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය ගල් සැපයීම<br>6x9 ගල් - 9 20700/-<br>1 1/2 ගල් - 4 18400/-<br>3/4 ගල් - 1 5000/-<br>1/2 ගල්- 15 60000/-<br>1 ගල් - 6 28800/-<br>ප්‍රවාහන ගාස්තු 26000/- | 57 | 280566 | 158900.00 |
| | එස්.කේ.ඩී.කන්ස්ට්‍රක්ෂන්<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | 58 | 280567 | 251000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීමේ දී සමිතියෙන් ගෙවන ලද මුදල් ආපසු ලබාගැනීම | 58 | 280568 | 300000.00 |
| | එස්.කේ.ජී.කන්ස්ට්‍රක්ෂන්<br>අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවීම | 59 | 280567 | 290000.00 |
| | ලංකා විදුලිබල මණ්ඩලය<br>2012 ජනවාරි මස විදුලිය බිල්පත පියවීම<br>පොදුවෙළඳසැල<br>මහජන පොළ<br>පොළ මුර කුටිය | 63 | 280569 | 16281.00 |
| | ලංකා විදුලිබල මණ්ඩලය<br>2012 ජනවාරි මස විදුලිය බිල්පත පියවීම<br>කාර්යාලය/යාබඳ ගොඩනැගිල්ල | 68 | 280569 | 18615.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බුලත්ගම නන්දන මහතාගේ නිවස ඇතුළු නිවාස වලට යන මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | 73 | 280575 | 162066.50 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>වැව්වත්ත වතු නිවාස මාර්ගය 1 අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 74 | 280575 | 137699.50 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>හුණුකුඹුර අතුරු මාර්ගය ii අදියර කර්මාන්තය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 75 | 280575 | 131211.21 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>හුණුකුඹුර පුනක්කන්වත්ත මාර්ගය 1 අදියර බැම් බැඳ කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 76 | 280575 | 394408.50 |
| | සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය<br>2011-12-31 සිට 2012-01-02 දක්වා ඉන්ධන බිල්පත | 77 | 280586 | 66677.57 |
| | සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය<br>2011-12-27 සිට 2011-12-30 දක්වා ඉන්ධන බිල්පත | 78 | 280586 | 30009.40 |
| | සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය<br>2011-12-12 සිට 2011-12-19 දක්වා ඉන්ධන බිල්පත | 79 | 280586 | 68692.65 |

| | | | | |
|---|---|---|---|---|
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය<br>2012-01-19 සිට 2012-01-26 දක්වා ඉන්ධන බිල්පත | 80 | 280586 | 61637.30 |
| 2012-02-17 | එම්.ජී.පියසේන<br>2012-01-12 දින සිට 2012-02-06 දින දක්වා එකතු කරන ලද බස්රථගාල් ගාස්තු වලින් කොමිස් මුදල් ගෙවීම | 81 | 280587 | 21000.00 |
| **2012-01-23 දින සිට 2012-01-15 දින දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් ( තානායම් ගිණුම )** | | | | |
| 2012-01-23 | ප්‍රියන්ත මුතුමාල<br>තානායම සඳහා මාළු ලබාගැනීම | 40 | 280311 | 45494.00 |
| | ප්‍රියන්ත මුතුමාල<br>තානායම සඳහා මාළු ලබාගැනීම | 41 | 280311 | 16275.00 |
| 2012-01-26 | ඉන්දික එරික් සිසිල්<br>තානායම සඳහා එළවළු ලබාගැනීම | 44 | 280314 | 26870.00 |
| | ඩිස්ටිලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී.<br>තානායම සඳහා රටබීම ලබාගැනීම | 45 | 280315 | 112271.76 |
| 2012-01-31 | එන්.අයි.ටී.ෆාම් ෂොප්<br>තානායම සඳහා කුකුළු මස් ලබාගැනීම | 50 | 280318 | 28800.00 |
| 2012-02-02 | ඊ.ඒ.ඩී.ඒ.නිරෝෂන්<br>තානායම සඳහා එළවළු ලබාගැනීම | 02 | 280322 | 24645.00 |
| | ජගත් එන්ටර්ප්‍රයිසස්<br>තානායම සඳහා ගෑස් ලබාගැනීම | 04 | 280324 | 14450.00 |
| 2012-02-03 | ඒ.එන්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සඳහා රටබීම ලබාගැනීම | 05 | 280325 | 25075.20 |
| | මිලර්ස් බ්‍රෙවරි ලිමිටඩ්<br>තානායම සඳහා බියර්ලබාගැනීම | 08 | 280327 | 13027.20 |
| | ලංකා විදුලිබල මණ්ඩලය<br>තානායම නව ගොඩනැගිල්ල සඳහා විදුලි සම්බන්ධතාවය ලබාගැනීම. | 10 | 280328 | 123755.00 |
| 2012-02-10 | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 11 | 280329 | 18659.00 |
| | ශ්‍රී ස්ටෝස්<br>තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 13 | 280329 | 21304.00 |
| | එන්.ටී.අයි.ෆාම් ෂොප්<br>තානායම සඳහා කුකුළු මස් ලබාගැනීම | 15 | 280331 | 29240.00 |
| | මිලර්ස් බ්‍රෙවරි ලිමිටඩ්<br>තානායම සඳහා බියර් වර්ග ලබාගැනීම | 23 | 280338 | 16146.00 |
| 2012-02-13 | ලංකා විදුලිබල මණ්ඩලය<br>2012 ජනවාරි මස විදුලිය බිල්පත පියවීම | 28 | 280342 | 47782.70 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2011 දෙසැම්බර් මස ජල බිල්පත | 29 | 280343 | 14253.50 |
| 2012-02-15 | ඒ.එන්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සඳහා රටබීම ලබාගැනීම | 32 | 280345 | 21100.04 |
| | ශ්‍රී ලංකා ට්‍රේඩින් කම්පැණි<br>තානායම සඳහා බීම වර්ග ලබාගැනීම | 34 | 280347 | 51360.16 |
| | ප්‍රියන්ත මුතුමාල<br>තානායම සඳහා මාළු ලබාගැනීම | 35 | 280348 | 89521.00 |

| | | | | |
|---|---|---|---|---|
| | එන්.අයි.ටී.ෆාම් ෂොප් තානායම සඳහා කුකුළු මස් ලබාගැනීම | 36 | 280349 | 34650.00 |
| | ඩබ්.එම්.මෙන්ඩිස් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් තානායම සඳහා රටබීම ලබාගැනීම | 37 | 280350 | 39271.18 |
| | රොක්ලන්ඩ් ඩිස්ට්ලරීස් පුද්ගලික සමාගම තානායම සඳහා රටබීම ලබාගැනීම | 41 | 280252 | 96363.67 |
| | ජෝති ස්ටෝර්ස් තානායමේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 47 | 280258 | 10868.00 |
| | ඒ.පී.ජගත් චන්ද්‍ර තානායමේ මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 31 | 280261 | 14345.00 |
| | එන්.අයි.ටී.ෆාම් ෂොප් තානායම සඳහා කුකුළු මස් ලබාගැනීම | 32 | 280262 | 17325.00 |
| | සෙනාල් මාර්කටින් තානායමේ මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 33 | 280263 | 48700.00 |
| | ශ්‍රී ස්ටෝර්ස් තානායමේ මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලාබැගනීම | 39 | 280266 | 15593.00 |
| | ශ්‍රී ස්ටෝර්ස් තානායමේ මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 43 | 280266 | 52194.00 |
| | ශ්‍රී ස්ටෝර්ස් තානායමේ මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 44 | 280266 | 17079.00 |
| | ශ්‍රී ස්ටෝර්ස් තානායමේ මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 45 | 280266 | 15011.00 |
| 2012-01-25 දින සිට 2012-02-13 දින දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් - ලංකා බැංකු ගිණුම | | | | |
| 2012-01-25 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2011 නොවැම්බර් මස ජල බිල්පත පියවීම නව බස්නැවතුම්පල | 01 | 000157 | 63739.90 |
| | ලංකා විදුලිබල මණ්ඩලය 2011 දෙසැම්බර් මස විදුලිය බිල්පත පියවීම නව බස්නැවතුම්පල | 2 | 000158 | 53496.00 |
| 2012-01-30 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2011 දෙසැම්බර් මස ජල බිල්පත පියවීම නව බස්නැවතුම්පල | 4 | 000159 | 64125.10 |
| | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් 2011 ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවල ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම | 5 | 000160 | 46666.00 |
| 2012-02-13 | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය 2012 ජනවාරි මස විදුලිය බිල්පත පියවීම - නව බස්නැවතුම්පල | 1 | 000161 | 54780.00 |

ඉහත සඳහන් මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම :**

07:01 බැංකියවත්ත පසුභාවිත ප්ලාස්ටික් ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ ( පිවිසුම් මාර්ගය සඳහා පැති බැම්ම, අන්තර් සම්බන්ධිත ගල් අතුරා පිවිසුම් මාර්ගය සකස් කිරීම හා ඉදිරිපස රැදවුම් බැම්ම ඉදිකිරීම ) නිම කිරීමේ කර්මාන්තය 852,462/-

ඉහත සඳහන් ඇස්තමේන්තුව අනුමත කල සභාව තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය වෙත පවරා මෙම කර්මාන්තයේ වැඩ කටයුතු ඉටුකිරීමට තීරණය කරන ලදී.

2012 වර්ෂයේ මාර්ග නඩත්තු යටතේ පහත සඳහන් මාර්ගයන් ප්‍රිමෙක්ස් යොදා සංවර්ධනය කර ඇති බැව් සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණි.

01. පෙට්ටිගල පාර
02. කරච්කැටිය පාර
03. වීරසුන්දරාරාම පාර
04. ගුවන් පාලම පාර

08. **ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම:**

08:01 **පරිගණක මිළදී ගැනීම :**

මෙම නගර සභා කාර්යාලයට අවශ්‍ය පරිගණක මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවා තිබූ අතර, පහත සඳහන් මිළ ගණන් ලැබී තිබුණි.

| අයිතමය | පී.සී.සිස්ටම් | ජාන් කම්පියුටර්ස් | විස්ඩම් කම්පියුටර්ස් |
|---|---|---|---|
| ඉන්ටෙල් ඩුවල්කෝ පරිගණකය | 63500/- | 61500/- | 63000/- |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති ජාන් කම්පියුටර්ස් ආයතනයෙන් අදාළ පරිගණකය මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබදෙන ලදී.

08:02 **කර්මාන්ත අංශය සඳහා වැලි ලබාගැනීම :**

| අයිතමය | රෝහිත නයනානන්ද | අනුර කුමාර | අජිත් නයනානන්ද | සුරේෂ් කුමාර | රංජිත් වික්‍රමරාච්චි |
|---|---|---|---|---|---|
| සභාවේ කර්මාන්ත සඳහා වැලි ලබාගැනීම. ( කියුබ් 01 ක් ) | 7200/- | 7500/- | 6800/- | 7100/- | 7300/- |

අවම මිළ පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

08:03 **කර්මාන්ත සදහා සිමෙන්ති මිළදී ගැනීම :**

| අයිතමය | සේනානී හාඩ්වෙයාර් බළන්ගෙඩ (මිටි 01 ක මිළ ) | ටෙරිකෝ බළන්ගොඩ (මිටි 01 ක මිළ ) | දේශානී හාඩ්වෙයාර් බළන්ගොඩ (මිටි 01 ක මිළ ) | නිම්නා හාඩ්වෙයාර් බළන්ගොඩ (මිටි 01 ක මිළ ) | මධුෂානී හාඩ්වෙයාර් බළන්ගොඩ (මිටි 01 ක මිළ ) |
|---|---|---|---|---|---|
| ටොකියෝ සුපර් සිමෙන්ති | 810.00 | 810.00 | 815.00 | 810.00 | 810.00 |

ලැබී ඇති මිළ ගණන් අතුරින් ආයතන 03 ක් සම මිළ ගණන් ලබා දී තිබුණු අතර, එම ආයතන අතුරින් ණය පදනම මත සිමෙන්ති ලබාදීමට ඉදිරිපත්ව ඇත්තේ තුඹගොඩ නිම්නා හාඩ්වෙයාර් ආයතනය පමණක් වන බැවින්, එම ආයතනයෙන් අවශ්‍ය සිමෙන්ති ප්‍රමාණය ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08:03 **හොර නෝට්ටු හඳුනාගැනීම සඳහා බ්ලැක් ලයිට් මැෂිමක් මිළදී ගැනීම :**

| අයිතමය | තරංගා ගිෆ්ට් - | ජෝති ස්ටෝර්ස් - බළන්ගොඩ | නිව් ජෝති ස්ටෝර්ස් බළන්ගොඩ |
|---|---|---|---|
| මොඩල් අංකඃ T.K.2028 Star වර්ගයේ Black Light Machine | 2750/- | 2000/- | 2300/- |

ඉහත සදහන් මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති ජෝති ස්ටෝර්ස් ආයතනයෙන් අදාල මිළදී ගැනීම සිදුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08:04 **කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා සුදු ලියුම් කවර මුද්‍රණය කිරීම :**

| අයිතමය | සසිත ප්‍රින්ටර්ස් - බළන්ගොඩ | සීගිරි ප්‍රින්ටර්ස් - බළන්ගොඩ | නිව් පුන්සඳ ප්‍රින්ටර්ස් - බළන්ගොඩ |
|---|---|---|---|
| 9"x4" ප්‍රමාණයේ සුදු ලියුම් කවරවල කාර්යාලීය විස්තර මුද්‍රණය කර සකස්කරදීම | 4.75 | 4.65 | 4.95 |

ලැබී ඇති මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇත්තේ සීගිරි ප්‍රින්ටර්ස් ආයතනය වන බැවින්, එම මිළ ගණන අනුව අදාල ලියුම් කවර ප්‍රමාණය මුද්‍රණය කරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08:05 **ඇල්ලෙපොල හෙළ පුබුදු සුභ සාධක සමිතියට අඩි 20 හට් එකක් සකස් කිරීම :**

| අයිතමය | තිස්ස අයන් වර්ක්ස් - බළන්ගොඩ | කුසුමන් අයන් වර්ක්ස් බළන්ගොඩ | යුනයිටඩ් අයන් වර්ක්ස් | ටෙක්නිකා අයන් වර්ක්ස් | චමින්ද ක්‍රියේෂන් |
|---|---|---|---|---|---|
| අඩි 10x20 ප්‍රමාණයේ හට් 01 සකස් කිරීම. වැඩ කුළිය හා ප්‍රවාහනය ඇතුළුව | 59075/- | 56625/- | 59750/- | 56500/- | 57200/- |

ලැබී ඇති මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් ඇත්තේ බළන්ගොඩ කුසුමන් අයන් වර්ක්ස් ආයතනයෙන් වන බැවින්, එම මිළ ගණන පාදක කරගනිමින් අදාළ සේවාව ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08:06 **බළන්ගොඩ බස්නැවතුම්පල ත්‍රී රෝද රථ සඳහා ස්ටිකර් ලබාදීම :**

| අයිතමය | බීඑම්පී ඩිජිටල් ඇඩ්වර්ටයිසින් | ලහිරු ඇඩ්වර්ටයිසින් | ෂහන්යා ඇඩ්වර්ටයිසින් |
|---|---|---|---|
| අඟල් 5 විෂ්කම්භයෙන් යුතු ස්ටිකර් 100 ක් මුද්‍රණය කරගැනීම | 37.50x100<br>3750/- | 34.50 x100<br>3450/- | 35.00 x100<br>3500/- |

ලැබී ඇති මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති තුඹගොඩ ලහිරු ඇඩ්වර්ටයිසින් ආයතනයෙන් අදාළ ස්ටිකර් ප්‍රමාණය සකස් කරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08:07 **ඇල්ලෙපොල හෙළ පුපුදු සුභ සාධක සමිතියට ප්ලාස්ටික් පුටු ලබාදීම :**

| අයිතමය | සෙනෙවිරත්න ස්ටෝර්ස් (ඒකක මිළ) | චාපාස් ෆර්නිචර්ස් (ඒකක මිළ) | චින්තක ෆර්නිචර්ස් (ඒකක මිළ) |
|---|---|---|---|
| නිල් කමල් එලියට් පුටු | 590/- | 650/- | 620/- |

අවම මිළ පාදක කරගනිමින් අවශ්‍ය පුටු ප්‍රමාණය මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08:08 **බළන්ගොඩ තානායම දෙමහල් ගොඩනැගිල්ල උඩුමහල ඉදිකිරීම සඳහා ගඩොල් මිළදී ගැනීම :**

| අයිතමය | රනහින්ගේ | ආර්.සූරසේන | ටී.ජී.එස්.වීරසේන |
|---|---|---|---|
| 6x4x9 ප්‍රමාණයේ ලොකු ගඩොල් | 9.00 | 8.00 | 8.50 |

අවම මිළ පාදක කරගනිමින් අවශ්‍ය ගඩොල් ප්‍රමාණය මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08:09 **බළන්ගොඩ බැංකියවත්ත ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ තත් ඇදීමේ කාර්යය**

| අයිතමය | සැම් ඩැම් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් | එන්.එස්.ලියනගේ , බුලත්ගම,බළන්ගොඩ | මදාරා කන්ස්ට්‍රක්ෂන් බුලත්ගම, බළන්ගොඩ | උඩුමල්වත්ත එන්ටර්ප්‍රයිසස්, කල්තොට, බළන්ගොඩ | සම්පත් ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස් රත්නපුර පාර |
|---|---|---|---|---|---|
| බළන්ගොඩ බැංකියවත්ත ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ තත් ඇදීමේ කාර්යය | 424,300/- | 451,470/- | 516,803/- | 629,290/- | 777,295/- |

අවම මිළ පිළිගෙන අදාළ සේවාව ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ** :- නැත

10. **යෝජනා**

10:01 **ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

01. කොම්පෝස්ට් ව්‍යාපෘතිය සදහා නව භූමි භාගයක් වෙන්කර ගැනීම සදහා සුදුසු ස්ථානයක් හදුනා ගැනීමට ක්‍රියා කිරිම.

02. රත්නපුර දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී ගාමිණී වික්‍රමසිංහ මැතිතුමා කළ සේවයට ගරු කිරීමක් වශයෙන් අනුස්මරණ ක්‍රීඩා තරගයක් මෙම නගර සභාව විසින් සංවිධානය කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී , ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පළාත් පාලන සතියේ ක්‍රීඩා දිනය නිමිතිකරගෙන ගාමිණී වික්‍රමසිංහ අනුස්මරණ ක්‍රීඩා තරගයක් පැවැත්වීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10:02 **ගරු නාගරික මන්ත්‍රී,ඒ.අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා :**

01. රාස්සගල පාරේ සුදර්ශනපුර ගම්මානයේ ඇති දෙවන පටුමග,තුන්වන පටුමග,හා හතරවන පටුමග කාණු දමා සංවර්ධනය කිරිම.

02. රාස්සගල පාරේ ඇති අතුරු මාර්ගයක් වන පුවක්ගහමුල්ල පාරේ 25 කට අධික ගෙවල් සංඛ්‍යාවක ජීවත් වන ජනතාවට ඇති පානීය ජල ප්‍රශ්නයට විසදුමක් වශයෙන් මීටර් 250ට පමණ වන පාරේ අවසානය දක්වා සියලු ගෙවල් වලට ජලය ලබා ගැනීමට හැකි වන පරිදි අගලේ ජලනලයක් යොදා දීම.

( මෙම නගර සභාව හා ජල සම්පාදන මණ්ඩලය හා මහජන බැංකුව එක්ව සහනදායී ණය පදනම මත නගර සභා බලප්‍රදේශයේ ප්‍රදේශ ගණනාවකට ජලය ලබාදීමට කටයුතු කල බවත් ඒ අනුව ඉහත සදහන් ප්‍රදේශයට ජලය ලබාදුන් බවත්, නමුත් එම පාරිභෝගිකයින් ජල බිල්පත් නොගෙවීම මත ජල සම්බන්ධතා විසන්ධි කර ඇති බැව් ගරු සභාපතිතුමන් විසින් දැන්වීය.)

ඉහත යෝජනා ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

10:03 **ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා :**

01. අනදමෙත්ගම බුද්ධි පෙර පාසලේ පාලිකාවන් සදහා නගර සභාවේ අනිකුත් පෙර පාසල් පාළිකාවන්ට ගෙවන සමාන දීමනාවක් ගෙවීම.

ළමුන් 20 කට වැඩි ප්‍රමාණයක් අධ්‍යාපනය ලබන්නේ නම්, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව රු.4000/- බැගින් ලබාදිය හැකි බවත්, මෙම පෙර පාසල පවත්වාගෙන යන ප්‍රජා ශාලාවට ජලය ලබාදීම සදහා ජල සම්පාදන මණ්ඩලය හරහා ඇස්තමේන්තුවක් සකස් කරගැනීමටත් කටයුතු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා වෙත ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

02. නගර සභාවට අළුතින් එක්කර ගත් ප්‍රදේශවල සුදුසු ස්ථාන හදුන්ගෙන නව විදුලි පහන් සවිකීරිම.

විපී පහන් සවිකිරීමට අවශ්‍ය ස්ථානය ලිඛිතව ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා වෙත ගරු සභාපතිතුමන් විසින් දැන්වීය.

03. නගර සභා සීමාව ඇතුළත අමතර පන්ති පවත්වන ආයතන වල ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට වෙන වෙනම ප්‍රමාණවත් පරිදි වැසිකිලි පහසුකම් තිබේ දැයි සොයා බලා සුදුසු පියවර ගැනීම .

උපකාරක පංති පවත්වන ස්ථානයන් හි අවශ්‍ය පහසුකම් තිබේ පරීක්ෂා කරන ලෙසත් අඩුපාඩු තිබේ නම් ඒවා සකස් කරගැනීමට අදාල අයට උපදෙස් ලබාදෙන ලෙසත්, එසේ නොකරන අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීමටත් කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වෙත උපදෙස් ලබාදෙන ලදී.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

10:04 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

01. 2012 නගර සභා අයවැය ලේඛනය මගින් ගරු මන්ත්‍රීවරුන් සඳහා සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන්කර ඇති නිසා, තමන් වෙත වෙන් වූ මුදලින් දොරවෙල මාගිරිස් මහතාගේ නිවාස දක්වා යන මාර්ගය සහ කාණුව සකස් කිරීම.

ඉහත යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

10:05 **ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

01. කිරිදිගල පොල්ගහගොඩ මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම

.

මෙම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

10:06 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ජේ.මලික්ෂා මැතිතුමා**

2012 නගර සභා අයවැය ලේඛනය මගින් ගරු මන්ත්‍රීවරුන් සඳහා සංවර්ධන සංවරධන කටයුතු වෙනුවෙන් මුදල් වෙන්කර ඇති නිසා, තමන් වෙත වෙන් වූ මුදලින් සුබයිර් අලීම් මාවතේ දෙවන පටුමග සංවර්ධනය කිරීම.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චම්ක ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11. **ආදායම් – වියදම් වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම.**

2012 වර්ෂයේ ජනවාරි මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 6,410,135.49 |
| වෙනත් ලැබීම් | 5,468,581.25 |
| **මුළු ලැබීම්** | **11,878,716.74** |
| පුනරාවර්ථන වියදම් | 3,828,578.55 |
| වෙනත් වියදම් | 4,946,933.00 |
| **මුළු වියදම්** | **8,775,511.55** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

- ❖ 2011.12.01 දින සිට 2012.01.02 දින දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වී ඇති ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම ඉන්ධන වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

2012.02.10 වන දින පැවති මහජන පුස්තකාල උපදේශක කමිටුවේ වාර්තාව සභාගත කරන ලදී.

මෙම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

## 13. වෙනත් කරුණු :

### 13:01 ගරු නාගරික මන්ත්‍රී, එම්.ජේ.මලික්ෂා මැතිතුමා :

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීවරුන්ට සංවර්ධන කටයුතු සඳහා රු.ලක්ෂ 10 බැගින් මුල්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින්, එම වරප්‍රසාදය විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ට ද ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී. එසේම පසුගිය මහා සභා රැස්වීමේ දී ගරු මන්ත්‍රීවරුන්ට ඉන්ධන දීමනාවක් ලබාගැනීම සඳහා සභා යෝජනාවක් සම්මත කල බැවින් එය අදාල බලධාරීන් වෙත යොමු කිරීමට අවධානය යොමුකරන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඉන්ධන මිල ඉහල යාම නිසා ජනතාව දැඩි අපහසුතාවකට ලක්ව ඇති බැව් වැඩිදුරටත් අදහස් දක්වමින් පවසන ලදී. බලගහමුල මංසන්දියේ ඇති හෝරාස්ථම්භයේ වේලාව නිවැරදි නොවන බැවින්, එය අදාල ආයතනය වෙත දන්වා නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් අදහස් දැක්වීම නිම කරන ලදී.

### 13:02 ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා :

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, නගර සභා බලප්‍රදේශයට අලුතින් එක් වු ප්‍රදේශ සංවර්ධනය කර අවශ්‍ය පහසුකම් සලසා බදු අයකරන මෙන් ඉල්ලීමක් කරන ලදී. රජය අත්තනෝමතිකව ඉන්ධන මිළ , ආහාර ද්‍රව්‍ය හා අනෙකුත් අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිළ වැඩි කිරීම නිසා රටේ සමස්ථ ජනතාව දැඩි ආර්ථික පීඩනයකට ලක්ව ඇති බැව් පැවසීය. ජනතාවට ජීවන වියදම දරාගත නොහැකි බවත්, මේවන විට විදුලිය ගාස්තු ද වැඩිකර ඇති අතර ඉදිරියේ දී ගෑස් මිළ ද වැඩිකරනු ඇති බැව් දැනගැනීමට ඇතැයිද පැවසීය. සාමාන්‍ය ජනතාවගේ සිට ඉහලම ආදායමක් ලබන අය දක්වාම මෙය බලපා ඇති බැවින් වැඩි කල මෙම ඉන්ධන මිලට එරෙහිව පසුගිය දිනවල රට පුරා උද්ඝෝෂන පැවැත් වු අතර, මීගමුවේ පැවති උද්ඝෝෂණය මර්ධනය කිරීමට පොලීසිය හා යුධ හමුදා විසින් කටයුතු කිරීමේ දී සිදු වු වෙඩි ප්‍රහාරයකින් තරුණයෙකු ජීවිතක්ෂයට පත් වු බවත් ඒ සම්බන්ධව විපක්ෂයේ විරෝධතාවය ප්‍රකාශ කරන අතර, ක්ෂණිකව මෙලෙස ඉන්ධන මිළ වැඩිකිරීම පිළිබඳව ද විපක්ෂයේ දැඩි විරෝධතාව ප්‍රකාශ කරන බවත් පවසමින් සිය කථාව නිම කරන ලදී.

### 13:03 ගරු නාගරික මන්ත්‍රී, එම්.නිමල් කරුණාරත්න මැතිතුමා :

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, කරදියමුල්ල ප්‍රජා ශාලා ගොඩනැගිල්ල නගර සභාව මගින් ඉදිකරන ලද අතර , එහි පවුල් සෞඛ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාමට මෙම සභාව මගින් අවසර ලබා දී ඇත. එම කාමරය තුළට එකමුතු සුභ සාධක සංගමයේ හට් සහ පුටු දමා ඇති නිසා, දරුවන්ගේ බර කිරීම හා ගර්භනීමාතාවන්ගේ කටයුතු ඉටුකිරීමට නොහැකි වී ඇති බැව් පැවසීය. එබැවින් මේ සම්බන්ධව අදාළ

අය වෙත දන්වා එම හට් එක සහ පුටු ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලීමක් කරමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

13:04 **ගරු නාගරික මන්ත්‍රී , චමික වැවේගෙදර මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, පසුගිය දා හදිසි අනතුරතික් අභාවප්‍රාප්ත වූ ක්‍රීඩා නිලධාරී ගාමිණී වික්‍රමසිංහමහතා සිහිවීම පිණිස අනුස්මරණ ක්‍රීඩා වැඩ සටහනක් පැවැත්වීමට සභා යෝජනාවක් ඉදිරිපත් වූ අතර, එය පළාත් පාලන සතියේ ක්‍රීඩා දිනය නිමිතිකරගෙන පැවැත්වීමට තීරණය වූ බැව් පැවසීය. එය තීරණයකට පමණක් සීමානොකර ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා , අදාල වැඩ සටහන බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩා නිලධාරීගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ පැවැත්විය යුතු යුතුර මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් හා කාර්ය මණ්ඩලයටත් අදාල ක්‍රීඩා වැඩ සටහන සඳහා සහභාගීවීමට අවස්ථාවක් සලසා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

තවදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා, රජය ක්ෂණිකව ඉන්ධන මිළ ඉහල දමා ඇති අතර , මේ සා විශාල ප්‍රතිශතයකින් ඉන්ධන මිල ඉහල ගිය ප්‍රථමවතාට මෙය බවත්, මෙය ජනතාවට විශාල බරක් යැයි ද පැවසීය. කුමන රජයක් බලයට පත් වුවද බඩු මිල පහත දැමීමට නොහැකි බැව් ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මාධ්‍ය හරහා ප්‍රකාශයක් කල බවත්, නමුත් මැතිවරණයක් ආසන්න වන විට ක්ෂණිකව බඩු මිළ පහල දැමීම සිදුවන බැව් පැවසිය. මහජනතාව දැඩි අසහනයකට හා අපහසුතාවකට ලක්වන අයුරින් ඉන්ධන මිල වැඩිකිරීම පිළිබඳව විපක්ෂයේ දැඩි විරෝධය ප්‍රකාශ කරන බැව් දන්වමින් සිය කථාව නිම කරන ලදී.

13:05 **ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, නගරයේ බදු ගෙවන ජනතාවට පිරිසිදු නගරයක අභිමානවත් අයුරින් ජීවත්වීමට හැකි පරිසරය මෙම සභාව විසින් නිර්මාණය කර ඇති බැව් පැවසීය. පසුගිය පාලන කාලය තුළ නගර සභා බලප්‍රදේශ තුළ සුවිශාල සංවර්ධනයක් සිදුකල අතර, මෑතක දී නගර සභා බලප්‍රදේශයට අයත් වූ ප්‍රදේශවල මංමාවත් සකස් කිරීම,විථි ආලෝක කිරීම, ජලය ලබාදීම ආදී පොදු සුභ සාධක සේවාවන් රැසක් විශාල මුදල් සම්භාරයක් යොදවා ඉටුකර ඇති බැව් පැවසීය. එම නිසා එකී ප්‍රදේශ වලින්ද වරිපනම් බදු අයකිරීමට හැකියාව ඇති බැව් දැන්වීය.

ඉන්ධන මිල ඉහල යාම සම්බන්ධව විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කල බවත්, වෙනත් රටවල ඉන්ධන මිල හා සසඳා බලන කල ලංකාවේ ඉන්ධන මිළ අඩු බවත් මෙම රජය ජනතාවට විවිධ සහනාධාර ලබාදෙමින් ජනතාවගේ ජීවන වෘත්තීන් ශක්තිමත් කරගැනීමට දායකත්වය දක්වන අතරම රට සීඝ්‍ර සංවර්ධනයකට යොමුකර ඇති බැව් පැවසීය. රටේ සංවර්ධනයත් සමඟ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත්වීම මත , නිවාස,ඉඩකඩම්,යාන වාහන ජනගහනය වැඩිවීම, ආදී සිදුව ඇති බැව් පැවසීය. රට දියුණුවීමත් සමඟ ජනතාවද දියුණු වී ඇති බැවින් ඔවුන්ගේ,අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට රජයට සිදුවන අතර, එම කාරණා ඉටුකිරීමේ දී ඉන්ධන මිළ ඉහල යාම, බඩු මිල ඉහල යාම ආදී සිදුවන බැව් පැවසීය. එසේම වැඩිවන ජනගහනයත් සමඟ ස්වභාවික ව්‍යසන වලට මුහුණ දීමට සිදුවන නිසා ඒ සඳහා රජයට විශාල වශයෙන් මුදල් වියදම් කිරීමට සිදුවන වන අතර ලෝක වෙළඳපලේ තෙල්මිල වැඩිවීම මත ද රජයට යම් යම් තීන්දු තීරණ වලට එළඹීමට සිදුවන බැව් පැවසීය. මෙම කාරණා නිසා ඉන්ධන මිල වැඩිවීම සිදුවන බවත්, මෙය ජනතාව අපහසුතාවකට ලක්කිරීම සිදුකල දෙයක් නොවන බවත් අවධාරණය කරමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

13:06 **ගරු උපසභාපති.ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

ගරු උපසභාපතිතුමා සභාව අමතමින් ඉන්ධන මිළ ඉහල යාම නිසා අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිළ ඉහල යෑමෙන් ජනතාව පීඩනයකට ලක්ව ඇති බැව් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ බව පැවසීය. වසර ගණනාවක් පැවති කුරිරු යුද්ධ නිමාකර කරමින්, ජනතාවට බියෙන් සැකෙන් තොරව ජීවත්වීමට අවස්ථාව සලසා දී ඇති අතර, විවිධ වැඩ සටහන් හරහා රට සීඝ්‍ර සංවර්ධනයකට යොමුකිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් කටයුතු කර ඇති බැව් පැවසීය.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අද දින සභාවට ඉදිරිපත් කල යෝජනා සැලකිල්ලට ගෙන ඒවා ඉටුකරදීමට ගරු සභාපතිතුමා එකඟතාවය පළකල බවත්, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ද යෝජනා රැසක් ඉදිරිපත් කල නමුත් ඒවා ඉටුකරදීම ප්‍රමාද කල බැව් පැවසීය.විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ගේ ඔවුන්ගේ යෝජනා අදහස් සැලකිල්ලට නොගන්නා බැව් ප්‍රකාශ කර සිටිය ද , මෙම සභාව කෙතරම් සාධාරණව කටයුතු කරනවා ද යන්න මෙයින් පැහැදිලි වන බැව් පවසමින් සිය කථාව නිම කරන ලදී.

14. **අවසානය :-**

**ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

ගරු සභාපතිතුමා කථා කරමින්, පළාත් පාලන සහ පළාත් සභා ගරු අමාත්‍ය අතාවුල්ලා අමාත්‍යතුමා අද දින ර/බළන්ගොඩ ජෙයිලානී ජාතික පාසලේ පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ විශේෂ ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වන බැව් දන්වා තිබෙන නිසා අප සියළු දෙනා ද එම අවස්ථාවට සහභාගී විය යුතු බැව් දැන්වීය.

ඉන්ධන මිල ඉහල යාම නිසා බඩු මිළ ඉහල යාම සම්බන්ධව මෙම සභාවේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විරෝධය ප්‍රකාශ කළ බවත් කුමන රජයක් බලයට පත්වුවද බඩු මිළ ඉහල කවදත් සිදු වු බවත්, නමුත් , රටේ ඒකීය භාවය ආරක්ෂාකරදීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් ලබාදුන් නායකත්වය අප සැම විටම අගය කල යුතු අතර, ඒ සම්බන්ධව අපගේ ප්‍රණාමය එතුමා වෙත පළකරන බැව් දැන්වීය. අප සැම විටම නගර සභා බලප්‍රදේශයේ බදු ගෙවන ජනතාවගේ සුභ සිද්ධියට අදාලවන කාරණා කෙරෙහි අවධානය යොමු කරමින් වරිපනම් බදු ගෙවන ජනතාවට කාර්යක්ෂම පළදායී සේවාවක් සැලසීමට නිරන්තරව කටයුතු කල යුතු බැව් පවසමින් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව නිමකිරීමට දායක වු ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාට සිය ස්තුතිය පළකරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.2.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.